**දිව්‍ය සත්ප්‍රසාද මංගලෝත්සවය** | **දේව ප්‍රකාශන** | 29-05-16

## පළමුවන දේව ප්‍රකාශනය

උත්පත්ති 14: 18-20

උත්පත්ති පොතෙන් උපුටා ගත් කොටසකි.

**සූප සහ මිදියුස පූජා කළේය.**

තවද, සාලෙම්හි රජ වූ පරමෝත්තම දෙවියන් වහන්සේගේ පූජක වූ මෙල්කිසෙදෙක් සූප සහ මිදියුස ගෙනැවිත් ඔහුට ආශීර්වාද කරමින්, "අහසත්, පොළොවත් මවා වදාළ පරමෝත්තම දෙවියන් වහන්සේ ආබ්‍රම්ට ආශීර්වාද කරන සේක් වා! ඔබේ සතුරන්, ඔබ අතට පාවා දුන් පරමෝත්තම දෙවියන් වහන්සේට තුති පැසසුම් වේ වා!"යි කීවේ ය. ආබ්‍රම් ද සියල්ලෙන් දසයෙන් එක ඔහුට දුන්නේ ය.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 110:1-4

පිළිතුර: ඔබ වනාහි සදහට ම පූජකයෙකි.

ගීය: සමිඳාණෝ මා සමිඳුන්ට කතා කොට, "මා නුඹේ සතුරන් නුඹේ පා යට ලන තෙක් මාගේ දකුණු පස අසුන් ගන්නැ"යි වදාළ සේක.

සමිඳාණන් සියොන්හි සිට ජයකොන්තය ඔබ අතට දුන් විට ඔබේ සතුරන් මැද රජකම් කළ මැනව. ඔබ සතුරන් සමග සටන් කරන දවසේ දී ඔබේ සෙනඟ සිය කැමැත්තෙන් ඔබට එකතු වන්නෝ ය.

අලුයම පිනි මෙන්, ඔබේ තරුණයෝ ඔබ වෙත පැමිණෙති. "නුඹ මෙල්කිසදෙක්ගේ පරපුරෙන් සදහට ම පූජකයෙක් ය"යි සමිඳාණෝ දිවුළ සේක; එය වෙනස් නොකරන සේක.

## දෙවන දේව ප්‍රකාශනය

1 කොරින්ති 11:23-26

පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

**ඔබ මෙම පූපය වළඳන, මෙම කුසලානෙන් පානය කරන සැම විට ම සමිඳාණන්ගේ මරණය සිහි කරන්නහු ය.**

මා ඔබට ඉගැන්වූ මේ පිළිවෙත ම ස්වාමීන් වහන්සේ ගෙන්ම ලැබුවෙමි. එනම් ස්වාමීන් වන ජේසුස් වහන්සේ පාවා දෙනු ලැබූ රාත්‍රියේදී පූපයක් රැගෙන ස්තුති කොට කඩා "මෙය ඔබ උදෙසා දෙන මාගේ ශරීරය ය. මා සිහිකිරීම පිණිස මෙය කරන්න" යි වදාළ සේක. එලෙසම රාත්‍රී කෑමෙන් පසු කුසලානයද රැගෙන "මේ කුසලාන මාගේ රුධිරයෙන් පිහිටුවන නව ගිවිසුම ය. යම් පමණ වර ඔබ මෙයින් පානය කරන්නහුද, එපමණ වර මා සිහිකිරීම පිණිස මෙය කරන්න" යි වදාළ සේක. ඔබ යම් පමණ වර මේ පූප අනුභව කරන්නහුද, මේ කුසලානෙන් පානය කරන්නහුද, එපමණ වර ස්වාමීන් වහන්සේ වඩින තුරු ඔබ උන්වහන්සේගේ මරණය ප්‍රකාශ කරන්නහු ය.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සුපුවත් ජය නද</u>** ජොහන් 6:51-52

ආලේලූයා! ආලේලූයා!
"ස්වර්ගයෙන් පහළ වන ජීවනදායක ආහාරය මම ය.
යමෙක් මේ ආහාරයෙන් වැළඳුවොත්, ඔහු සදහට ම ජීවත් වන්නේ ය"යි
ස්වාමීන් වහන්සේ වදාළ සේක.
ආලේලූයා!

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** ලූක් 9:10-17

ලූක් තුමගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**සියල්ලෝ ම ආහාර වළඳා තෘප්තිමත් වූහ.**

අපෝස්තුළුවරු ආපසු පැමිණ, තමන් කළ සියලු දේ උන් වහන්සේට දන් වූ හ. එවිට උන් වහන්සේ ඔවුන් වෙන්කොට බෙත්සයිද නම් නුවරකට ඉවත් ව ගිය සේක. එහෙත් සමූහයෝ එපවත් අසා උන් වහන්සේ පසුපස්සේ ගියහ, උන් වහන්සේ ඔවුන් පිළිගෙන, දෙවියන් වහන්සේගේ රාජ්‍යය ගැන ඔවුන්ට වදාරා, සුවය අවශ්‍ය වූ අය සුව කළ සේක. සවස් වෙමින් එත් ම, දෙළොස් දෙනා උන් වහන්සේ වෙත අවුත්, "මෙහි අප සිටින්නේ පාළු පෙදෙසක බැවින්, අවට නියම්ගම් හා ගොවි ජනපදවලට ගොස් නවාතැන් හා කෑම සපයාගන්නා පිණිස සමූහයා හැරිය මැනවැ"යි කී හ. උන් වහන්සේ, "ඔබ ඔවුන්ට කෑමට යමක් දෙන්නැ"යි වදාළ සේක. "අප ළඟ නම්, රොටි පහකට හා මසුන් දෙදෙනෙකුට වඩා නැත; කළ යුතු දේ නම්, අප ගොස් මේ මුළු සෙනඟට කෑම මිල දී ගැනීම ය"යි ඔව්හු කී හ. එසේ කීවේ, පුරුෂයන් පන්දහසක් පමණ එහි සිටි බැවිනි. එවිට උන් වහන්සේ, "ඔවුන් පණස් දෙනා බැගින් කාණ්ඩ වශයෙන් හිඳුවන්නැ"යි ශ්‍රාවකයන්ට වදාළ සේක. ඔව්හු එසේ කොට, හැම දෙන ම හිඳගන්න සැලැස්සූ හ. එකල උන් වහන්සේ රොටි පහත් මසුන් දෙදෙනාත් ගෙන, ස්වර්ගය දෙස බලා, ආශීර්වාදය පවසා, ඒවා කඩා, සමූහයා ඉදිරියෙහි තබන පිණිස ශ්‍රාවකයන්ට දුන් සේක. සියල්ලෝ ම කා තෘප්තියට පැමිණියහ. ඔවුන් කෑ පසු ඉතිරි වූ කැබලිවලින් කූඩා දෙළොසක් රැස් කරගන්නා ලදී.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.com/ වෙත පිවිසෙන්න.